# යෝජිත ත්‍රස්ත විරෝධී පනත - මූලික අදහස්
# විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
# සැප්තැම්බර් 2023

2023 සැප්තැම්බර් 15 වැනි දින ගැසට් පත්‍රයේ පළ කරන ලද යෝජිත ත්‍රස්ත විරෝධී පනතේ සංශෝධිත කෙටුම්පත පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය අවධානය යොමු කර තිබේ. පනත් කෙටුම්පතේ අනුවාදයක් 2023 මාර්තු 22 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලදී. මෙම පනත් කෙටුම්පතට අදාළ ගැටළු කිහිපයක් මතු කරමින් ප්‍රකාශයක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිකුත් කළ අතර 2023 මැයි 2 වන දින අධිකරණ අමාත්‍යාංශය විසින් ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලෙස සිදු කළ දැනුම්දීමට ප්‍රතිචාර වශයෙන් ප්‍රධාන කරුණු-ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී.

දඬුවම් ක්‍රමයක් ලෙස මරණ දඬුවම ඉවත් කිරීම සහ රැඳවුම් නියෝගවලට අදාළ විධිවිධානවල වෙනස්කම් සිදු කරමින් මාස දෙකක ආරම්භක කාලයක් සඳහා පමණක් රැඳවුම් නියෝග නිකුත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයාට බලය ලබා දීම වැනි යෝජිත ත්‍රස්ත විරෝධී පනතේ මුල් කෙටුම්පතට සංශෝධන කිහිපයක් සිදු කර ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සඳහන් කරයි. කෙසේවෙතත්, සංශෝධිත පනත් කෙටුම්පතෙහි, ත්‍රස්තවාදය යන වරද ඉතා පුළුල් ලෙස දක්වා තිබීම, දිගු කාලීන රක්ෂිත බන්ධනාගාර ගතකිරීම් ඇතුළුව චෝදනාවකින් තොරව දීර්ඝ කාලයක් රඳවා තබා ගැනීමට අවසර ලබා දීම, අධිකරණයට සහ මූලික අයිතිවාසිකම්වලට හානි වන පරිදි විධායකයට අධික බලතල ලබා දී තිබීම, මිලිටරිකරණය පවත්වාගෙන යාම වැනි ගැටලුකාරී විධිවිධාන ඇතුළත් වේ. විශේෂයෙන්ම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇඳිරි නීති නියෝගවලට අදාළ විධිවිධාන සම්බන්ධයෙන් දැඩි සැලකිල්ල යොමු කරන අතර එය ව්‍යවස්ථාවට පටහැනි මෙන් ම විධායක ජනාධිපතිවරයාගේ බලය තවදුරටත් පුළුල් කිරීමට දැරූ උත්සාහයක් ද වේ. තවද, 2022 වසරේ දී සිදු වූ අරගලය තුළින් මෑතකදී විදහා දැක්වුණු විධායක ජනාධිපති ධූරය අහෝසි කරන ලෙසට වන ජනතා ඉල්ලීම්වලට පටහැනිව, යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත විධායක ජනාධිපතිවරයාගේ බලය පුළුල් කිරීමේ නවතම උත්සාහය බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සඳහන් කරයි. වැඩි දේශපාලන වගවීමක් සහ පාලනයේ වෙනසක් සඳහා වන ඉල්ලීම් නොතකා, යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත මඟින් සංවිධාන තහනම් කිරීමට, සීමා කිරීම් නියෝග සහ රෙගුලාසි නිකුත් කිරීමට මෙන් ම තහනම් ස්ථාන නියම කිරීමට හිමි වන බලය ඇතුළුව විධායකයට පුළුල් බලතල ලබා දෙයි.

විශේෂයෙන්ම යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත කෙටුම්පත් කිරීමේදී සියලුදෙනා ඇතුලත් කරගත් සහ විනිවිදභාවයෙන් යුත් උපදේශන ක්‍රියාවලියකට ගමන් කිරීමෙන් තොරව ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පුළුල් ලෙස සංශෝධනය කිරීමට රජය විසින් කල්මරමින් හිඳ හදිසියේ ම ගනු ලැබූ ප්‍රයත්නයන් හී ගැටළුකාරීභාවය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය උත්සුකයන් නැවත අවධාරණය කරයි. එවැනි ක්‍රියාවලියක ව්‍යවස්ථාපිත වගකීමක් ඇති ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට පවා පනත් කෙටුම්පතේ පිටපතක් ලබා ගැනීම සඳහා රජය වෙතින් ලිඛිතව ඉල්ලා සිටීමට සිදු වූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ සම්බන්ධයෙන් කනස්සල්ලෙන් යුතුව සඳහන් කරයි. විශේෂයෙන් ම, කිසියම් නීතියක් සම්බන්ධව අව්‍යාජ උපදේශනයක් සඳහා එකී නීතිය භාවිතා කිරීමෙන් සෘජුවම බලපෑමට ලක් වන සියලු පුද්ගලයන් සහ ප්‍රජාවන් ඇතුළත් කරගත් විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලියක් අත්‍යාවශ්‍ය අතර ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතෙහි සැබෑ බලපෑම සහ කොතරම් දුරට එතුළින් වධහිංසා පැමිණවීම සහ අපයෝජනය පහසු කර තිබේද යන්න අවබෝධ කර ගැනීම සඳහා ඒ යටතේ දිගු කාලීනව රඳවා සිටි රැඳවියන් සහ ඔවුන්ගේ සමීපතමයන් ඇතුළු කණ්ඩායම්වල උපදේශනය ලබාගැනීම අත්‍යවශ්‍ය වේ. මහජන අදහස් කැඳවනු ලැබූව ද ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පතේ ඇතැම් ගැටලුකාරී විධිවිධාන නිවැරදි කිරීමට අපොහොසත් වීමෙන් පෙන්නුම් කරනුයේ මෙය සියලුදෙනා ඇතුලත් කරගත් නීති සම්පාදන ක්‍රියාවලියක් ලෙස සත්‍ය වශයෙන්ම සිදු කිරීමට වඩා ඒ බවට වූ සංකේතාත්මක උත්සාහයක් බවයි.

එපමණක් ද නොව, ත්‍රස්ත විරෝධී පනත හඳුන්වා දෙනු ලබන්නේ ශ්‍රී ලංකාව තුළ ත්‍රස්ත විරෝධී නීති අනිසි ලෙස භාවිතා කර ඇති සන්දර්භයක් තුළ වන අතර, අපයෝජනය සහ දණ්ඩමුක්තිය ඇති එවන් සංස්කෘතියක් තුළ යෝජිත ත්‍රස්ත විරෝධී පනත ද එවැනි භාවිතයන්ට නතු විය හැකිද යන්න පිළිබඳ විවේචනාත්මක කනස්සල්ලක් මතුව තිබේ. නීති සම්පාදන ක්‍රියාවලියේ සීමිත විනිවිදභාවය හා බැඳුනු එකී සංස්කෘතිය හේතුවෙන් එවන් යෝජිත නීතිවල අභිප්‍රායන් පිළිබඳ ජනතා විශ්වාසය අවම වී තිබේ.

ඉහත සඳහන් ගැටළු සැලකිල්ලට ගනිමින්, යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත ඉවත් කර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජය වෙතින් ඉල්ලා සිටින අතර, ත්‍රස්ත විරෝධී නීතියක් කෙටුම්පත් කිරීම සඳහා වන ඕනෑම නව ක්‍රියාවලියක් විනිවිදභාවයෙන්, වගවීමෙන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අදාළ සියලුම පාර්ශවකරුවන් අතර සිදු කෙරෙන ශක්තිමත් උපදේශන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් විය යුතු බව නැවත අවධාරණය කරයි. මේ සම්බන්ධයෙන් වන අව්‍යාජ සහ පාරදෘශ්‍ය උපදේශන ක්‍රියාවලියකට සම්බන්ධ වීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය අඛණ්ඩ කැමැත්ත ප්‍රකාශ කරයි.

යෝජිත ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සකස් කරනු ලබන සවිස්තර වාර්තාවක් ළඟදීම ගෙන එනු ලැබේ.